## මූලික තොරතුරු පත්‍රිකාව

# ඇග්‍රි සේවින්ග්ස් ගිණුම

| නිෂ්පාදනයේ ස්වභාවය | මූලිකාංග සහ ප්‍රතිලාභ | මූලික තැන්පතුව සහ ගාස්තු | සුදුසුකම් | මූලික නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| කෘෂිකර්මාන්තයේ නියැලෙන ගනුදෙනුකරුවන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම හරහා ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම ඉලක්ක කරගත් ඉතිරි කිරීමේ ගිණුමකි. | **පොලී අනුපාතය:**<br><br>011 5411411 දුරකතන අංකය අමතා හෝ https://www.sdb.lk/en/rates ලෙසින් වන අපගේ නිල වෙබ් අඩවියට ඔබට වැඩිදුර විස්තර ලබාගත හැකිය.<br><br>**මූලිකාංග:**<br><br>• ඉහළ පොලියක්.<br>• කැමති වාර ගණනක් මුදල් ආපසු ගැනීමේ හැකියාව.<br>• SLIPS/CEFT පහසුකම.<br>• ස්ථාවර නියෝග පහසුකම.<br><br>**මූල්‍ය ප්‍රතිලාභ සහ දිරිදීමනා, ප්‍රවර්ධන ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ:**<br><br>• ගිණුමේ තත්ත්වය සහ ගනුදෙනු වාර්තා නිරීක්ෂණය වෙනුවෙන් පාස්පොත් පහසුකම හිමි වේ.<br>• විද්‍යුත් ගිණුම් වාර්තා පහසුකම.<br>• ගනුදෙනුකරුට අන්තර්ජාල බැංකු පහසුකම ලබා ගැනීමට හැකියාව ඇත. | • අවම මූලික තැන්පතුව රුපියල් 1,000/=.<br><br>• පවත්වාගත යුතු අවම ගිණුම් ශේෂය රුපියල් 1,000/=.<br><br>• ගිණුම පවත්වාගෙන යාම, අනෙකුත් ගාස්තු සහ ගිණුම වසා දැමීම සම්බන්ධ ගාස්තු සඳහා https://www.sdb.lk/en/fees-and-charges වෙබ් අඩවියට පිවිසෙන්න.<br><br>• ගිණුම් විවෘත කිරීම සහ අවම ගිණුම් ශේෂය පිළිබඳව තොරතුරු 011 5411411 දුරකතන අංකය හරහා අපේ සේවා මධ්‍යස්ථානය අමතා හෝ හෝ ළඟම SDB ශාඛාවට පිවිස ලබාගත හැක. | ගිණුම ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අවම තැන්පතු වටිනාකම් රුපියල් 1,000/=.<br><br>වයස අවුරුදු 18 වැඩි ඕනෑම ශ්‍රී ලාංකිකයෙක්ට ගිණුමක් විවෘත කළ හැක.<br><br>**ඉලක්කගත ගනුදෙනුකරුවන්:**<br><br>• ඕනෑම කෘෂිකාර්මික කටයුත්තක නියැලී සිටින ගොවීන්.<br>• කිරි ගොවීන්.<br>• ධීවර කර්මාන්තයේ නියැලෙන්නන්.<br>• කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වටිනාකම් දාමයට අයත් වන ඕනෑම සාමාජිකයෙක්.<br><br>**ගිණුම් විවෘත කිරීම, කල් පිරීමට පෙර මුදල් නැවත ලබා ගැනීම, මූල්‍ය ගනුදෙනුකරුවන් විසින් අරමුදල් මාරු කිරීම හා සම්බන්ධ වන සීමාවන් පිළිබඳව තොරතුරු:**<br><br>ඔබට ළඟම SDB ශාඛාවට පිවිස ලබාගත හැක.<br><br>**ගිණුම් විවෘත කිරීම සඳහා වන ක්‍රියා පිළිවෙල:**<br><br>011 5411411 දුරකතන අංකය හරහා අපේ සේවා මධ්‍යස්ථානය අමතා හෝ ඔබට ළඟම SDB ශාඛාවට පිවිස අදාළ තොරතුරු ලබාගත හැක. | පොලී ගෙවීම ගිණුමට අදාල වන කොන්දේසිවලට අනුකූලව සිදු කෙරෙනු ඇත.<br><br>කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ ගනුදෙනුකරුවන්ට ගිණුම් විවෘත කළ හැක.<br><br>වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා කරුණාකර පහත වෙබ් යොමුව භාවිතා කරන්න:<br><br>https://www.sdb.lk/images/pdf/downloads/terms-and-conditions-opening-an-account.pdf |

SDB බැංකුව

#ඔබවවටින

# මූලික තොරතුරු පත්‍රිකාව

# ඇග්‍රි සේවින්ග්ස් ගිණුම

**<u>තැන්පතු රක්ෂණ ආවරණය/අවසරයෙන් තොරව (අත්වැරදීමෙන්) සිදු කෙරුණු ගනුදෙනු වාර්තා කිරීම/අක්‍රීය ගිණුම්/අත්හරින ලද දේපල.</u>**

- මුදල් මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ වැඩසටහන යටතේ තැන්පතු වගකීම් බැංකුව විසින් රක්ෂණය කර ඇති අතර ඊට අය කෙරෙන මුදල වෙනුවෙන් තැන්පතුකරුවෙක් හට රුපියල් 1,100,000/= ක උපරිමයක් දක්වා වන්දි හිමි වෙනු ඇත.
- අවසරයෙන් තොරව හෝ අත්වැරදීමෙන් සිදු කෙරුණු ගනුදෙනුවක් හඳුනාගත් වහාම ගිණුම පවත්වා ගෙන යන බැංකු ශාඛාවට දැනුම් දීම හෝ 011 5411411 දුරකතන අංකය හරහා අපේ සේවා මධ්‍යස්ථානය අමතා දැනුම් දිය යුතුය.
- වසර දෙකක් පුරාවට ගිණුමට මුදල් බැර කිරීමක් හෝ ගිණුමෙන් මුදල් ලබා ගැනීමකින් තොරව පැවතුණ හොත් එම කාලය අවසානයේදී ගිණුම නිෂ්ක්‍රීය වශයෙන් සළකනු ඇත.
- යම් ගිණුමක් වසර 10 ක කාලයක් පුරා කිසිදු ක්‍රියාකාරකමකින් තොරව පැවතුණ හොත් එම කාල පරිච්ඡේදය අවසානයේදී එම ගිණුම අත්හැර දමන ලද දේපලක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කෙරෙනු ඇත.

**අපගේ නිෂ්පාදන සහ සේවාවන්ට අදාළ ගාස්තු සහ ගෙවීම් පිළිබඳව වැඩිදුර විස්තර** ඔබට 011 5411411 දුරකතන අංකයෙන් අපේ සේවා මධ්‍යස්ථානය අමතා හෝ https://www.sdb.lk ලෙසින් වන අපගේ නිල වෙබ් අඩවියට පිවිස ලබාගත හැකිය.

**<u>පැමිණිලි සිදු කරන පිළිවෙල:</u>**

ගනුදෙනුකරුවන් හට ඔවුන්ගේ යෝජනා සහ පැමිණිලි පහත සඳහන් ආකාරයට යොමු කළ හැක.

- 011 5411411 දුරකතන අංකයෙන් අපේ සේවා මධ්‍යස්ථානය අමතා හෝ 011 2832571 දුරකතන අංකය/customercare@sdb.lk ඊ මේල් ලිපිනය හරහා ප්‍රධාන කාර්යාලයේ පිහිටා ඇති පාරිභෝගික පැමිණිලි අංශයට යොමු කිරීමෙන් හෝ පැමිණිලි භාර ප්‍රධාන නිලධාරියා වෙත headfcp@SDB.lk ඊ-මේල් ලිපිනය හරහා පැමිණිලි යොමු කිරීම සිදු කළ හැක. පැමිණිලි සිදු කරන පිළිවෙල පිළිබඳව වැඩිදුර විස්තර සඳහා https://www.sdb.lk යොමුව හරහා අපේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න.

**<u>ඔබේ පැමිණිලි තැපැල් මඟින් යොමු කිරීමට:</u>**

භාර නිලධාරී - පාරිභෝගික පැමිණිලි භාර ගැනීමේ අංශය,
ප්‍රධාන කාර්යාලය, SDB බැංකුව, අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06.

අපේ නිෂ්පාදන සහ සේවාවන්ට අදාළ තොරතුරු ලබා ගැනීමට හෝ වෙනත් කරුණක් සම්බන්ධයෙන් අප හා සම්බන්ධ වීමට ඔබට අවශ්‍ය නම් සමීපතම ශාඛාවට පිවිස හෝ අපේ දුරකතන සේවා මධ්‍යස්ථානය අමතා හෝ එය සිදුකළ හැක. සමීපතම SDB ශාඛාව පිළිබඳව දැන ගැනීමට 011 5411411 දුරකතන අංකයෙන් අපේ සේවා මධ්‍යස්ථානය අමතන්න. නැතිනම් https://www.sdb.lk යොමුව හරහා අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න.